Copyrighted Material

# TERRY GOODKIND

WIZARD'S FIRST RULE

# සත්‍ය ගවේෂකා

මායාකරුගේ පළමු රීතිය

1 කොටස

පරිවර්තනය

දිලීප් ප්‍රසන්න සෙනෙවිරත්න

MusesBooks®

MusesBooks

www.musesbooks.com



නිකොබරිස්
බටහිර දේශය
හිම-බාධකය
ඉහළ වෙන් ඩිකය
හාටිලන්ඩ්
ට්‍රන්ටි
විල
ඇගඩන් රිච්
සවුත්ර්වන්
කින්ග්ස්පෝර්ට්
ගොහොරු බිම්
වැසියන්ගේ දේහය
ඌෂ් ගංගාව


අයිඩින්ඩ්‍රිල්
ඩ'හරා
මධ්‍යම
දේශය
ඝීමා-බාධකය
ගැලයා
ජනතා
මාලිගය
කෙල්ටන්
අශ්‍රිත්
නිම්නය
ටැමරන්ග්
කර්න් ගංගාව
හැළිඹිඹූ ගංගාව
වන සීමාව
පුරාතන
ලෝකය
ටනිමුරා

Copyrighted Material

# 1

එය අසාමාන්‍ය අමුතු පෙනුමැති වැලකි. මලානික වෛවර්ණ පත්‍රයෙන් යුතුව, බෝල්සම් ෆර් ශාකයේ සුමට මතුපිට ග්‍රහණයට ගනිමින් නැඟීසිටි එය, ක්‍රමයෙන් ෆර් ශාකය ජීවිතාවසානය කරා ගෙනයන බවක් පෙනිණ. වැල විසින් ඇති කළ මාරාන්තික ග්‍රහණයෙන් තුවාල ලත් ෆර් ශාකයේ කඳ දිගේ එහි යුෂ වැගිරෙමින් තිබිණ. එමෙන්ම වියළී කරකුට්ටම්ව ගිය අතුපතර පවා සැලෙන්නට වූවේ, මරණීය තුවාල ලත් ශාකය නඟන කෙඳිරියක් බඳු හඬක් උදැසන තෙත් වාතලය හරහා මුදාහරිමිනි. වැලේ වපසරිය හා සමානව පහළට එල්ලී ඇති කරල්, අසාමාන්‍ය අමුතු පෙනුමැති වැලට ආරක්ෂාව සපයන මුර සෙබළුන් කැලක් වැන්න.

ප්‍රථමයෙන්ම ඔහුගේ අවධානය ඒ කරා යොමුවූවේ එදෙසින් හමා ආ අප්‍රසන්න දුර්ගන්ධය නිසාවෙනි. එය ජීවිතයේ කිසි කලෙකත් ජීරණය වන කිසිවකින් හෝ ඔහු අත් නොවිඳි අන්දමේ දුගඳකි. වැල දක්නට ලැබීමත් සමඟම හටගත් ව්‍යාකූලත්වයේ මිහිදුම පලවාහරිනු වස් ඝන හිසකෙස් අතරින් අතැඟිලි යැවූ රිචර්ඩ්, හාත්පස පිරික්සීය. වැලත්, පණ අදින දැවැන්ත වෘක්ෂයත් හැරුණුවිට සියල්ල සාමාන්‍යය. 'වෙන්' වනාන්තරයේ මේපල් ගස් ඍතු විපර්යාසයට අනුගතවෙමින් රත්පැහැ ගැන්වීගෙන එමින් තිබේ. මන්දමාරුතයට සැලෙමින් ඒවා ස්වකීය ආඩම්බරකාර රත් සළු ලෙළදෙවමින් තිබෙන ආකාරය චමත්කාරජනක දසුනකි. සීතල රාත්‍රීන් සමඟ හාර්ට්ලන්ඩ් වනපෙතේ වන, 'වෙන්' වනයේ සොහොයුරු තුරුලතාවන්ද නුදුරු දිනයෙක රත් සළුවෙන් සැරසෙන බව ඔහු දනී. තවමත් කොළ පැහැය දරාගත් ඕක් ගස් පවා අවසානයේ ඍතු විපර්යාසයට අනුගතව ස්වකීය කොළ පැහැ කබා උනාදමනු ඇත.

ජීවිතයේ වැඩි කාලයක් වනයේ ගතකිරීමේ පළපුරුද්ද හේතුවෙන් වනාන්තරයේ දක්නට ලැබෙන ගහකොළ, සතාසීපාවා පිළිබඳ පමණක්

Copyrighted Material



නොව කුඩා පැළෑටි ගැන පවා රිචර්ඩ් තුළ වූයේ නොමඳ දැනුමකි. නාමිකව දන්නා හඳුනන තුරුලතා ප්‍රමාණය අතළොස්සකැයි ගිණිය හැකි වුවද, බොහෝ තුරුලතා පැළෑටි ප්‍රමාණයක් දුටු පමණින් හඳුනාගැනීමේ හැකියාවක් ඔහුට තිබුණේය. කුඩා දරුවෙකුව සිටි අවදියේ පවා ඔහුගේ කාලයෙන් වැඩි ප්‍රමාණයක් ගෙවීගියේ රිචර්ඩ්ගේ තලතුනා මිත්‍රයා මහලු ශෙඩ් සමඟ වනයේ ඒ මේ අත ඇවිදමින් බෙහෙත් පැළෑටි ආදිය සෙවීමටය. ඒ සෑම ගමනකදීම මහලු ශෙඩ් බොහෝ දෑ කියාදුන්නේය. ඒ ඒ ශාකයන්හි පල ප්‍රයෝජන, ඇතැම් ගස්වැල් වැවෙන ස්ථාන පවා ඔහු කියාදුන් දෑ අතර විය. ඊට අමතරව දක්නට ලැබෙන ඇතැම් ගස්වැල් හා පැළෑටි ආදියට විවිධ නම් යොදමින් ඒවා හඳුනාගන්නා ආකාරයද ශෙඩ් කියාදුන් අතර, එවන් දෑ උගෙනගනිමින් වින්දනයක් සේම මහා දැනුම් සම්භාරයක්ද කොලුවා ලබාගත්තේය. ශාක සම්බන්ධයෙන් ශෙඩ් විසින් පසු කලෙක අසන ලද සෑම ප්‍රශ්නයකටම නිරවද්‍ය පිළිතුරු ලබාදෙමින් රිචර්ඩ් පෙන්වාදුන්නේ තමා වනය පිළිබඳ මනා දැනුවත් බවක් අත්කොටගෙන තිබෙන බවකි. මහල්ලා පවා, ළාබාල රිචර්ඩ් තුළ උගැන්මට පවත්නා පිපාසාව පැසසුමට ලක්කළේ එහෙයිනි.

කරුණු කාරණා එසේ වෙතත් මේ මොහොතේ දක්නට ලැබෙන අසාමාන්‍ය පෙනුමැති වැල සම්බන්ධයෙන් නම් කිසිදු අවබෝධයක් ඔහුට තිබුණේ නැත. ඔහු එය මීට පෙර දැක තිබුණේද එක් වතාවකදී පමණි. ඒද වනාන්තරයේදී නොවේ. පියාගේ නිවෙසේදීය. වෘත්තියෙන් සංචාරක වෙළෙන්දෙකු වූ රිචර්ඩ්ගේ පියා, තවමත් මිනිස් පා පහස පවා නොලද දුර බැහැර ඉසව්හි සංචාරය කිරීම තම විනෝදාංශය සේම රැකියාව වශයෙන්ද තෝරාගෙන සිටි අයෙකි. ඔහුගේ රැකියාව වූයේ, එවැනි සංචාරයන්හිදී සොයාගත් දුර්ලභ දෑ ඒවා කෙරෙහි උනන්දුවක් දක්වන්නන් හට අලෙවි කිරීමයි. එබැවින් ඔහුගේ පියා සොයා පැමිණි, දුලබ දෑ අගයන ධනවත්තු සුලබ වූහ. අලුත් යමක් සොයායෑමේ ආශාවෙන් මැඬී සිටි ඔහුගේ පියා එක් දෙයක් සොයාගැනීමෙන් පමණක් සංතෘප්තියට පත් නොවූයේ, හැකිතාක් ඉක්මනින් තව තවත් සංචාරයන්හි යෙදුණේය. රිචර්ඩ් විසින්ම සකසන ලද නිල් පැහැති මැටි බඳුනක් පියාගේ නිවෙසේ වූ අතර, මේ මොහොතේ දක්නට ලැබෙන අසාමාන්‍ය වැල සම්බන්ධයෙන් ඔහු තුළ වූ ඉපැරැණිම සහ එකම මතකය වන්නේ, ඒ තුළ දමා තිබී සොයාගත් කුඩා අතු කැබැල්ල පමණකි.

කුඩා කල සිටම පියා නිවෙසෙහි නොසිටින විට ශෙඩ් සොයා යෑමේ සිරිතක් රිචර්ඩ්ට තිබිණි. එසේ වතුදු වසර කිහිපයකින් පමණක්

Copyrighted Material



ඔහුට වඩා වැඩිමල් වූ රිචර්ඩ්ගේ සොහොයුරා, මයිකල් නම් ශෙඩ් සමඟ කිසි කලෙකත් පයුරුපාසානම් පැවැත්වීමට නොගියේය. ශෙඩ්ගේ කර්ණකටුක දේශනා ඇසීමෙහිලා හෝ වනය කෙරෙහි හෝ රුචිකත්වයක් නොදැක්වූ හෙතෙම, බොහෝවිට කාලය ගතකළේ නගරයේ වෙසෙන දේශපාලනික හැකියාවක් පැවැති මිනිසුන් සමඟය. වසර පහකට පමණ මත්තෙන් පියාගේ නිවෙස හැරදමා, තමා වෙනුවෙන්ම නිවෙසක් සකසාගැනීමට තීරණය කළද, වැඩි කාලයක් පියා සමගින් ගතකිරීමේ සිරිතක් රිචර්ඩ් තුළ පැවතිණ. පියා හමුවීමට යෑමෙන් වැළකී සිටීමේ හැකියාවක් ඇත්ත වශයෙන්ම ඔහුට තිබුණේද නැත. එහෙත් මයිකල් තමාටම කියා නිවෙසක් ඉදිකරගත් දා සිටම පියා හමුවට ගියේ නම් ඒ කලාතුරකිනි. ඔහු කියාසිටියේ පියා මුණගැසීමට යාමට තරම්වත් කාලයක් තමාට නැති බවය. තමා කාර්යබහුල බවය. එවන් විටෙක බාල පුත්‍රයා වන රිචර්ඩ් හා පියා අතර පවත්නා බැඳීම වඩාත් වර්ධනය වීම පුදුමයට කරුණක් නොවේ. නිවෙසින් පිටතට යන සෑමවිටෙකම පාහේ රිචර්ඩ් වෙනුවෙන් කිසියම් පණිවුඩයක් නිල් පැහැති මැටි බඳුන තුළ දමා යෑම ඔහුගේ පියා පුරුද්දක් කොට ගත්තේද එහෙයිනි. මේ මොහොතේ දක්නට ලැබෙන දැවැන්ත අමුතු පෙනුමැති වැලේ කැබැල්ලකැයි කොලුවා විසින් හඳුනාගෙන තිබෙන ශාකමය කොටස පවා ඔහුට හමුවූයේ එලෙසිනි.

මීට සති තුනකට පෙර දිනෙක මයිකල් හදිසියේ රිචර්ඩ් සොයා පැමිණියේ, තම පියාව නිවසේදීම ඝාතනය කර දමා ඇති බවට ශෝකී පණිවුඩයක්ද රැගෙනය. පියාගේ නිවෙස වෙත නොයා සිටින මෙන්ද, පියාගේ මරණය හමුවේ ඔහුට කළ හැකි යමක් නොවන බවටද මයිකල් විසින් කරන ලද ප්‍රකාශනයන්, ඉල්ලීම් යන්තමින් හෝ මායිම් නොකළ කොලුවා නොබෝ වේලාවකින්ම පියාගේ නිවෙසට ගොස් සිටිනු දක්නට ලැබිණි. මයිකල් කී සියල්ලම ගතානුගතිකව ඉටුකළ යුගය රිචර්ඩ් අවසන්කොට තිබුණේ බොහෝ කලෙකට පෙරය. පියාගේ දේහය දැක බලාගැනීමේ වුවමනාවක් ඔහුට තිබිණි. එහෙත් එවන් අවස්ථාවක් නොලැබුණේ, රැස්ව සිටි අසල්වැසියන් විසින්ද ඔහු වළකන ලද නිසාමය. දේහය නොදක්නා ලද නමුදු, දැවමය පොළොවේ ගලාගිය කුඩා ජලාශ බඳු වියළි, විශාල රුධිර පැල්ලම් නම් ඔහුට දක්නට ලැබිණි. නිවෙස වටා රැස්ව හුන් අසල්වැසියෝ මරණය සම්බන්ධයෙන් විවිධාකාර පරිකල්පනයන් එකිනෙකා අතර හුවමාරුකොට ගත්තෝය. ඒවා කොලුවාගේ කනවැකීමට ඉඩ නොතැබීම සඳහා ඔවුන් ප්‍රවේශම් සහගත වුවද, රිචර්ඩ් පසුවූවේ ඔවුන් කියන්නක් අසා දැනගැනීමේ

Copyrighted Material



වුවමනාවෙනි. මේ මොහොත තුළ වුව රහස් හඬින් මුමුනන ලෙසින්, පියාගේ මරණය සම්බන්ධයෙන් උහු විවිධාකාර මතවාදයන් ඉදිරිපත් කරති. ඔහු ඔවුන් අසලට පැමිණෙන විට ඒ සියලු කතා-බතාවෝ හිටිපියෙන් නැවතෙති. සියල්ල හුදු සානුකම්පිත ස්වරයෙන් සිදුකෙරෙන ශෝකප්‍රකාශ පමණක් බවට පත්වෙයි. එයින් සිදුවන්නේ රිචර්ඩ්ගේ සිත තුළ පවත්නා වේදනාව තව තවත් වර්ධනය වීම පමණකි. කෙසේවෙතත් ඔවුන් තමාගෙන් සඟවන, එකිනෙකා හා දොඩමලු වන සියලු කාරණා ඇත සීමා-බාධකයෙන් පැමිණි අදෘශ්‍යමාන බලවේගයන් හා මායාවන් සමඟ බැඳීගත් මිථ්‍යා විශ්වාස බැව් රිචර්ඩ්ට දැනගැනීමට ලැබුණේ විටින් විට රහසෙන් කන් දී තිබූ බැවිනි.

පියාව මරාදමා තිබූ නිවෙස කුණාටුවකට හසු වූ කලෙක මෙන් උඩු-යටිකුරුකොට තිබුණේ යැයි කිවහොත්, එය කිසිසෙයිනුදු අතිශයෝක්තියක් නොවේ. නිවසේ සියලුම දෑ අතපතගෑමට ලක්ව තිබුණේය. පියාගේ දැවමය නිවහන පෙරළා දමා ඇති ආකාරය දකිත්ම ඔහු තුළ හටගත්තේ වචනයෙන් කිව නොහෙන තරමේ තිගැස්මකි. කෙසේවෙතත්, අවුස්සා හැඩිකරන ලද්දවුන්ගේ අතැඟිල්ලකිනුදු කිලිටි නොවූ යම් දෙයක් නිවෙසේ තිබී සොයාගැනීමට කොලුවාට හැකි විය. ඒ වූ කලි රාක්කයේ වූ නිල් පැහැති මැටි බඳුනයි. ඔහු පළමුවරට වැල් කැබැල්ල දුටුවේ එහිදීය. දැනුදු රිචර්ඩ්ගේ කලිසම් සාක්කුවක බහා තිබෙන්නේ එම වැල් කැබැල්ලමය. අමුතු පෙනුමින් යුතු වැල් කැබැල්ලෙන් තාත්තා කියන්නට උත්සාහ ගත්තේ කුමක්දැයි ඔහුට අනුමාන කළ නොහැකි වූවේය.

පියාගේ මරණයත් සමඟින් දැරිය නොහැකි ශෝකයත්, මානසික අවපීඩනයත් රිචර්ඩ්ව වෙළාගත්තේය. තමා ලෝකය තුළ තනිවී යැයි ඔහුට දැනිණි. අම්මාගේ මරණය සිදු වූ කුඩා කාලයේදී සිටම තාත්තා රිචර්ඩ්ගේ ලෝකයම බවට පත්ව තිබීම ඊට හේතුවයි. මයිකල් තමා අසලම සිටින බව ඔහු දැනසිටියේය. එසේ වුවද පියා මළ ශෝකය ඔහු කෙරේ ඇතිකළ බලපෑම යන්තමින් හෝ සමනය කිරීමෙහිලා මයිකල් හේතුවක් වූවේ නැත. තාත්තා නිතර නිවෙසින් බැහැරව සිටියද, ඇතැම්විට සති ගණන් නොපැමිණ සිටියද, කොහේ හෝ ඔහු සිටින බවත්, කවදා හෝ දිනයක ඔහු පැමිණෙන බවත් මීට පෙර රිචර්ඩ් දැනසිටියේය. එහෙත් දැන්, පියාගේ නැවත පැමිණීම අපේක්ෂා කළ නොහැක්කකි.

පියාගේ මිනීමරුවා සොයායෑමේ වුවමනාවක් රිචර්ඩ් තුළ පැවතියද මයිකල් ඔහුට ඒ සඳහා ඉඩදුන්නේ නැත. හමුදාවේ ශූර

MusesBooks®

www.musesbooks.com

Copyrighted Material



සෙබළුන් රැසක් මේ වනවිටත් ඒ සම්බන්ධයෙන් කටයුතු කරන බවත්, රිචර්ඩ් ඒ සියල්ලෙන් ඉවත්ව සිටීම ඔහුගේ සුරක්ෂිතතාවය පිණිස හේතු වන බවත් මයිකල් කියාසිටියේය. තමා සොයාගත් වැල් කැබැල්ල සම්බන්ධයෙන් ඔහු මයිකල්ට නොකීවේද එහෙයිනි. ඔහු කටයුතු ඇරඹුවේ තනිවමය. තෙසතියක් පුරාවට, ඔහු හාර්ට්ලන්ඩ් වනාන්තරය පීරමින් සිටියේය. මිනිසුන් ගමන්ගන්නා කුඩා අඩිපාරවල් ඔස්සේද, අසා තිබුණද කිසි කලෙකත් පය නොතැබූ අඩිපාරවල් ඔස්සේද, වැල් කැබැල්ලේ මව් ශාකයක් සොයාගනු රිසියෙන් ඇවිදගියේය. එහෙත් ඔහුගේ අපේක්ෂාව මුදුන්පත් වූවේ නැත.

සීමා-බාධකයට වඩාත් නුදුරින් පිහිටි 'වෙන්' වනපෙත පිරික්සා බැලීමට රිචර්ඩ් අන්තිමේදී තීරණය කළේය. ඒ සඳහා හේතු වූවේ, හරියාකාරව මේ යැයි සඳහන් කිරීමට හෝ හඳුනාගැනීමට හෝ නොහැකි ලෙසින් කොලුවාගේ මනසට නැගෙන අස්වාභාවික කෙඳිරීමකි. හාර්ට්ලන්ඩ් වනයේ ඇතත් මැතත් පිරික්සීමේ යෙදෙන විට ඒ රහසිගත හඬ, විටෙක සිනාවෙන් ඔහුගේ වෙහෙස හාස්‍යයට ලක්කළේය. තවත් විටෙක, ඔබ සොයා බැලිය යුත්තේ සීමා-බාධකය අසල, වෙන් වනාන්තරය තුළ බව හඬගා කියාසිටියේද ඒ හඬමය. මනසේ ඇතිවන කැලඹීමකැයි, සංකූලතාවයකැයි තමාටම දේශනා තබාගනිමින් මිමිනීම බැහැර කළද, මේ මොහොත වනතුරුත් ඒ හඬ රිචර්ඩ් හට ඇසෙමින්, දොඩමින් පවත්නා බව නම් මුසාවක් නොවන්නේය.

මව්වැල සොයාගත් විට පියාගේ මරණය සම්බන්ධයෙන් කිසියම් අදහසක් ලැබේයැයි යන සිතුවිල්ලෙන් මෙතුවක් පසුවූවද, වැල සොයාගැනීමත් සමඟ රිචර්ඩ් පත්වූවේ දැඩි අපහසුතාවයකටය. ඊළඟට කළ යුත්තේ කුමක්දැයි ඔහුට වැටහෙන්නේ නැත. කුමක් සිතිය යුතුදැයි කියා හෝ ඔහු දන්නේ නැත. තමා හා මෙතුවක් සරදම් කළ මුනුමුනුවේ මඟපෙන්වීමේ අවශ්‍යතාවය කොලුවාට තදින්ම දැනුණේ මෙවිටය. ඔහු සවන්දුන්නේය. කසුකුසුව ස්වකීය පරිකල්පනයකැයි දනිතත්, ශෙඩ් පවා එවැන්නක් කියාදී තිබුණත්, රිචර්ඩ් කසුකුසුව බලාපොරොත්තුවෙන් අසාසිටියේය. එහෙත් අවශ්‍යම අවස්ථාවේ එය ඔහු හැරදමා ගොස් තිබිණි.

අවසානයේ ඔහු, මරණයට ගොදුරුවෙමින් අවසන් සුසුම් පොද වාතලය හා මුසුකරමින් පසුවන දැවැන්ත ෆර් ශාකය දෙස, කල්පනාකාරී මුහුණින් යුතුව බලාසිටියේය. ඔහු, තම පියාගේ මළගම යළිත් සිහිකළේය. ශාකයේ මළගමත්, පියාගේ මළගමත් එක හා සමාන අන්දමින් දැන් ඔහුට දැනෙයි. පියා මියයන විටත් වැල්

www.musesbooks.com

Copyrighted Material



කැබැල්ල ඒ සමීපයේ තිබිණි. දැන් වැල, ෆර් ශාකයේ මළගමටද පාර කපමින් තිබෙන්නේය. වැල තිබෙන ස්ථානයක මරණයට වැඩි දෙයක් බලාපොරොත්තු විය නොහැකි බවටත්, වනාන්තරයටම වැල ශාපයක් බවටත් හැඟීමක් ඒ හා සමඟ සිත වෙළාගත්තෙන්, වහවහා ක්‍රියාත්මක වූ හෙතෙම ශාකයෙන් පිටතට වැල අදින්නට උත්සාහ ගත්තේ උමතු වූවෙකු පරිද්දෙනි. ශාකයේ කඳ මත දැඩිව වෙළීගත්තද වැලේ පසරු කිහිපයක් ගලවා දමන්නට කොලුවාගේ කාය ශක්තිය ප්‍රමාණවත් විය.

එහෙත් ඊළඟට වැල රිචර්ඩ්ව සපාකෑවේය.

ශාකයේ කරල් රැඳි එක් වැල් කැබැල්ලක් ජීවය ලත් කලෙක පරිද්දෙන් එසවී එක්වරම රිචර්ඩ්ගේ පිටි-අත්ලට වේගවත් පහරක් එල්ල කළෙන්, විස්මිත රාවයක් මුවඟට නඟාගත් හේ වේදනාවෙන් රිදුම්දෙන අත්ලෙන් යුතුව පසෙකට පැන්නේය. පහරකෑ ස්ථානය වහවහා පිරික්සා බලන විට ඔහුට දක්නට ලැබුණේ, සම මස් විනිවිදිමින් අභ්‍යන්තරයට කිඳාබස්නා කටුවකි. කාරණාව පැහැදිලිය. වචනයේ පරිසමාප්තයෙන්ම, වැල අන්තරාදායකය. ඔහු වහා තම පිහිය සොයා ඉණපටිය දක්වා අත යොමුකළේ, අත්ල හාරා කටුව පිටතට ඇදගැනීමේ අපේක්ෂාවෙනි. ජීවිතයේ පළමු වතාවට තම පිහිය තමාට අමතක වූ බව ඔහුට අවබෝධ වන්නට තවත් තත්පර කිහිපයකට වඩා ගතවූවේ නැති. වනවැදීමේදී රැගෙන යා යුතු මූලික ආම්පන්න අතර වන තම පිහිය අමතක වූවේ කෙසේදැයි පළමුකොට ඔහුට ඇතිවූවේ පුදුමයකි. එහෙත් පවත්නා මානසික සංකූලතාවය එවන් සරල දෙයක් පවා අමතකකොට දැමීම කෙරෙහි හේතු වූ බවක් ඉනික්බිති ඔහුට වැටහිණි. කළ යුත්තක් සිතාගත නොහැකි වූවෙන්, නිය සහිත ඇඟිලිතුඩු භාවිතයෙන් කටුව පිටතට ගැනීමට රිචර්ඩ් උත්සාහ ගත්තේ, මේ වනවිටත් අත්ලෙන් නැගෙන වේදනාව වර්ධනය වෙමින් තිබූ හෙයිනි. තවත් නොසිතූවක්ම සිදුවිය. කටුව පිටතට ගැනීමට යත්න දරන සැමවිටම ජීවය ලද්දාක් පරිද්දෙන් එය මස විනිවිද කිඳාබසින්නට උත්සාහ ගන්නා බවක් ඔහුට දැනිණි. ඊළඟට ඔහු මහපටැඟිල්ල යොදාගනිමින් තුවාලය හාරා හෝ කටුව ඉවතට ගන්නට දහි දැමුවේය. එහෙත් කටුව තව තවත් කිඳාබැසීම හැර අත් වූ අන් ප්‍රතිඵලයක් නොමැත. එය පිටතට ගැනීමට උත්සාහ ගන්නා සැමවිටම කටුව තවත් ඇතුළට ගමන් කළේය. රුධිරය ගලා එනතුරුම උත්සාහ ගත්තද, කටුව ගලවාගත නොහැකි වූවෙන් රිචර්ඩ් අවසානයේ එය අතැර දැමුවේය. කටුව රුධිරය තුළත්, තුවාලයේ මස තුළත් සැඟවීගත්තේ, එය කිඳාබසිමින් ගමන්ගන්නා බව වඩාත් තහවුරු කරමිනි.

Copyrighted Material



යමක් සොයා හාත්පස පිරික්සන රිචර්ඩ්, සරත් ඍතුවේ ප්‍රතිඵලයක් ලෙසින් දුඹුරුවන් තිත් වැටුණු පත්‍ර සහ නිල්වන් ගෙඩිවලින් පිරි කුඩා නැනිබෙරි ගසක් පාමුල තිබී අපේක්ෂා කළ දේ සොයාගත්තේය. ඒ ඕම් පැළයකි. සහනයට පත් අයුරෙන් බිමට නැඹුරු වූ හෙතෙම, එහි මූල පද්ධතිය නොකැඩෙන අයුරින් එය ප්‍රවේසමෙන් ගලවාගත්තේය. ඊළඟට එය මිරිකා එහි ඇලෙනසුලු යුෂ ද්‍රාවණය, සැපීම සිදු වූ ස්ථානයට වැගිරෙන්නට ඉඩහැරියේය. තුවාල ඉක්මනින් සුවපත් කිරීමේ මහානුභාව සම්පන්න ගුණයක් ඕම් ශාකයේ යුෂ තුළ පවත්නා බව ඔහුට කියාදුන්නේ මහලු ශෙඩ් මිස අනෙකෙකු නොවේ. මහල්ලා පිළිබඳ සිහිවෙත්ම කෘතඥතාපූර්වක මඳහසක් ඔහුගේ මුහුණට නැඟිණි. මෘදු සුමුදු ශාකපත් ඔහුට සැමවිටම ශෙඩ්ව සිහිකැඳවීය. ඕම් යුෂ තුවාලයට එක්වෙත්ම අත්ල හිරිවැටී ගිය අතර, ඔහුගේ පශ්චාත්තාපයට හේතු වූවේ කටුව ඉවත් කරගත නොහැකි වීමම පමණක් නොවේ. එය දැවටෙමින්, ඇඹිණෙමින්, තව තවත් ඇතුළට කිඳාබසිමින් පවත්නා බවක් ඔහුට දැනිණ.

හාත්පස පැතිරගත් නේකවිධ කුරුලු කූජනයන්ද, වනාන්තරයක පැතිර පැවැතිය හැකැයි සිතිය හැකි නා නා මාදිලියේ ශබ්ද සංධ්වනියන්ද එක්වරම නැවතී මරණීය නිහැඬියාවක් පරිසරය වසාගත්තේ, උදුරාගත් ඕම් ගස පාමුල ඔහු මෙසේ උක්කුටිකයෙන් හිඳ, අතැඟිල්ලකින් වළක් හාරා එය යළිත් තැන්පත් කරමින්, සිටුවමින් සිටින අතරයඃ ඒ වටා වූ පාසි, වියළිපත්, රොඩුබොඩු ආදිය ඕම් පැළයට සමීප කරවමින්, එය යළිත් වැඩෙන්නට හැරීමේ ගුණාංගය ඉටුකරමින් සිටින විටය. එහෙත් එක්වනම සර-සර හඬක්, ඇතිල්ලෙන හඬක් හා විසිල් කිරීමකදී නැගෙන්නාක් බඳු හඬක් නිහඬ බව බිඳලමින් ඇසෙන්නට විය. දැවැන්ත අඳුරු සෙවණැල්ලක්, තුරුහිස් මුඳුන්වලට ඉහළින් මතුවී මහපොළොව වසාගත්තේද ඒත් සමඟය. ගස් අතර සැඟවගත් කුරුල්ලන්ගේ හඬ යළිත් මතු වූ අතර, එහි වූවේ බියපත් ස්වභාවයකි. නුදුරෙහි පැමිණෙන අනතුරක සේයාව හඟවන බවකි. සෙවණැල්ල බියකරු බව කියාපාන ගතියකි. සෙවණැල්ල නැගෙන්නේ කුමකින්දැයි වටහාගනු රිසියෙන්, කහ පැහැයත් කොළ පැහැයත් සම්මිශ්‍ර තුරුවියන අතරින් වහවහා ඉහළට නෙත් හෙළන රිචර්ඩ් දුටුවේ, නිසියාකාරව කුමක්දැයි හැඳිනිය නොහැකි රක්තවර්ණ, සුවිශාල දෙයකි. සීමා-බාධකයෙන් පිටතට පැමිණෙන විවිධාකාර දෑ පිළිබඳ වන දහසකුත් කටකතා මතකයට නැගුණෙන් ඇටමිදුලු දක්වාම තම සිරුර සීතල වී යන බවක් කොලුවාට දැනිණ.

Copyrighted Material



'අන්තරාය දරුවන් තුන්දෙනෙකුගෙන් යුක්තය'යි ගැමියන් අතර ප්‍රචලිත කතාවක් රිචර්ඩ්ට සිහිවිය. පළමුවැන්න, වැල විසින් රැගෙන ආ මරණයේ පෙරනිමිත්ත විය හැකිය. දෙවැන්න, අහස්කුස වසා පැතිරෙන රක්තවර්ණ වස්තුවට බාරදිය හැකිය. එසේ නම් තෙවැන්න කුමක් විය හැකිද? එය කුමක් වුවද කම් නැත. තුන්වැනි අන්තරාය හමුවීමේ කිසිදු වුවමනාවක් තමා තුළ නොවන බව ඔහුට වැටහිණ.

'මිනිසුන්ගේ අන්ධ විශ්වාස'යි තමාටම කියාගත්තද, තැතිගැන්ම ගණනය කළ නොහැකි වූවෙන් රිචර්ඩ් වහවහා දුවන්නට පටන්ගත්තේය. දිවයන අතරතුර පවා ඒ අතිවිශාල වස්තුව කුමක්දැයි සිතීමෙන් ඔහුට ගැලවිය නොහැකි විය. ඒ තරම් විශාල යමක් අහසේ පාවීමද ගැටලුවකි. ඇතැම්විට එය වලාකුළක් වන්නට ඇතැයි ඊළඟට ඔහුට සිතිණි. නොඑසේ නම්, ආලෝකය විසින් ඇතිකරන ලද දෘෂ්ටිමායාවක්ද විය හැක. නැත. තමාවම රවටාගැනීමෙන් අත්වන සෙතක් නැත. එය කිසිසෙයිනුදු වලාකුළක් නොවන බව ඔහු වටහාගෙන සිටියේය.

වලාව දෙසට ඉක්මන් බැල්මක් හෙළීමේ අදහසින් යළිත් අහස දෙස බැලූ රිචර්ඩ්, කඳුයාය හා සමාන්තරව විහිදෙන අඩිපාර දෙසට දුවන්නට විය. අඩිපාර හා සමව පැතිරෙන බිම්කඩෙහි පැතිකඩක් විවර වන්නේ ප්‍රපාතාකාර බෑවුමකට බවත්, අහස වඩාත් හොඳින් නිරීක්ෂණය කිරීමට එකී ස්ථානය මනාව ගැළපෙන බවත් ඔහු දනී. පෙරදින රාත්‍රියේ වට වැස්සෙන් තෙත් වූ කොළ අතු ගණනාවක් මුහුණේ වැදුණු බව සැබෑය. පඳුරු වශයෙන් වැවීගත් කටු ගාල් ආදිය කලිසම් කකුල් ඉරා දමමින් ගමනට බාධාවක් වූ බවද සැබෑය. එහෙත් මග හරහා පෙරළීගිය ගස්කඳන්වලට හෝ ගල් අතරින් ගලාගිය කුඩා දිය දහරාවන්ට හෝ කොලුවා නවතාලිය නොහුණු වූවේය. ඔහු ඒවා මතින් පනිමින් වේගයෙන් ඉදිරියට දිවගියේය. සූර්යාලෝකය පවා උසුළු විසුළු කළ නමුදු අවශ්‍ය කළ දර්ශනය ලබාදීමට තරම් කාරුණික වූවේ නැත. දැන් රිචර්ඩ්ගේ හුස්මගැනීම වේගවත්ය. මුහුණ මතින් දාහය ප්‍රවාහයක් ගලායමින් තිබෙන්නේය. දිවයන වේගයෙන්ම ප්‍රපාතය පහළටද ඇදීයාමේ අනතුර දැනී හදගැස්ම වේගවත්ය. එහෙත් ඔහු, අඩිපාර හරහා පෙරළී තිබූ ගසක හැපී පය පැකිළී ගමන නවතන තුරුම වේගය හීන නොකළේය.

රිචර්ඩ් රක්තවර්ණ වස්තුව සොයා යළි යළිත් අහස්කුස පිරික්සා බැලීය. එය ඉතා ඈතින් මෙන්ම කුඩා ලෙස දර්ශනය වූවෙන් වස්තුව කුමක්දැයි වටහාගැනීම තව තවත් දුෂ්කර විය. එහෙත් එයට පියාපත් ඇතැයි එක්වරම ඔහුට සිතිණි. දීප්තිමත් නිල් පැහැති අහස අත්ලෙන්

Copyrighted Material



ආවරණය කරමින් ඔහු වඩාත් තදින් එය නිරීක්ෂණය කළේ, රක්තවර්ණ වස්තුවේ පියාපත් චලනය වේදැයි දැනගැනීමේ අටියෙනි. එහෙත් එය අනතුරුව කන්දක් පසුපසින් සැඟවී දර්ශනයෙන් මැකීගියේ තමා දුටු වස්තුව රතු පැහැති යැයි ගිවිසීමට පවා නොහැකි වන ලෙසිනි.

ප්‍රපාතාකාර ඉසව්වක, ඉහළ කඳු මුදුනක විටින් විට මන්දමාරුතය චණ්ඩමාරුතයක්ව හමා ඒම ස්වභාවිකය. පහළට ඇදීයාම වළකාලමින් කුඩා අඩිපාරේ පසෙකින් තිබූ විශාල කළුගලකට හේත්තුවක් දමාගත් රිචර්ඩ්, කුඩා පැළයක දිරාගිය ඉපල් කඩමින් පහළින් වන ට්‍රන්ට් විල දෙස බලාසිටියේය. මඳක් කල්පනා කළ හේ, වැල ගැනත්, අහසේ දක්නට ලැබුණු රක්තවර්ණ වස්තුව ගැනත් මයිකල්ට කිවයුතු යැයි තීරණයකට එළැඹියේය. බොහෝවිට කරන්නාක් මෙන් කතාවේ අවසාන අර්ධය හිනාවකින්, සමච්චලයකින් අයියා බැහැර කර දමන බව නම් ඔහුට සැක නැත.

නැත, ඔහු මයිකල්ට කිසිවක් කිව යුතු නැත. පියාගේ මිනීමරුවා සොයා යාමත්, සීමා-බාධකය අසලට ගමන්ගැනීමත් තහනම්කොට ඇති විටෙක එවැන්නක් කළ බව මයිකල්ට කීම අනිවාරතේ ඔහුගේ උදහසට ලක්වීමකි. තම උපදෙස් නොපිළිපැදීම සම්බන්ධයෙන් හේ අටෝරාසියක් දෝස්මුර තමාගේ මුහුණටම එල්ල කරනු ඇත. මයිකල් කාටකාටත් උපදෙස් ලබාදෙන්නෙකි. අණපනත් පනවන්නෙකි. පියාගේ මිනීමරුවා සොයා නොයන්නැයි කළ ඉල්ලීම, තමාගේ ආරක්ෂාව පිණිස පමණක් කරන ලද්දකැයි රිචර්ඩ් දැනසිටියද මයිකල්ගේ උපදෙස් ලබාදීමේ ගතිගුණය රිචර්ඩ් නොරිස්සන්නක්ම විය. ඇතැම්විට පියාට පවා ඒ කාලයේ, මයිකල් අණ කිරීම්වලට සමාන උපදෙස් ලබාදුන්නේය. ජීවිතයේ බොහෝ කාලයක් මයිකල්ගේ උපදෙස් මතින්, මයිකල්ට වුවමනා ලෙසින් හැසිරුණද මේ මොහොතේ රිචර්ඩ් එවැන්නකට සූදානම් නැත. දැන් ඔහුද වයසින් හා සිරුරින් වැඩුණු යෞවනයෙකු බව මයිකල්ද වටහාගත යුතුය.

සොයුරා සම්බන්ධයෙන් වූ අකාරුණික විනිශ්චයන් රිචර්ඩ් මඳකට බැහැර කළේය. අද මයිකල්ට ඉතා වැදගත් දිනයකි. මන්ත්‍රණ සභාවේ; කවුන්සිලයේ ප්‍රධානියා තනතුර ඔහුට හිමිවන්නේ අදය. දැන් ඉතින් හාර්ට්ලන්ඩ් නගරයේ මතු නොව මුළු මහත් බටහිර දේශයේම මිනිස් ජීවිතවලට ඇඟිලි ගැසීමේ හැකියාව මයිකල්ට ලැබෙනු ඇත. මිනිස් ජීවිත හා දේපළ පිළිබඳ පෙරට වැඩි වගකීමක් ඔහු මත පැවරෙනු ඇත. පියාද නොමැති බැවින්, එකම සහෝදරයා වන තමාගෙන් මයිකල්

Copyrighted Material



මීට වැඩි උදව්වක්, උපකාරයක් බලාපොරොත්තු වන බව රිචර්ඩ් දැනසිටියේය.

සන්ධ්‍යා කාලයේ මයිකල්ගේ නිවෙසේ පැවැත්වීමට නියමිත විශාල සාදය ඔහුගේ මතකයට නැගුණේ ඒත් සමඟිනි. බටහිර කලාපයේ වැදගත් පුද්ගලයන් රැසක්, බොහෝ දුර ඈත සිට පවා, එහි පැමිණෙනු ඇත. හරිනම් වනයේ හක්කලම් කරමින් වැල් සෙවීමත්, රතු පැහැති තටු ගැන සිතීමත් පසෙකලා මේ මොහොතේ රිචර්ඩ් කළ යුත්තේ, සාදයේ කටයුතු සංවිධානය කරගැනීම සඳහා අයියාට උපකාර කිරීමයි. සාදය සම්බන්ධයෙන් වඩ වඩාත් සිතත්ම එහි වන නේකප්‍රකාර ආහාරපාන සිහියට නැගීමෙන්දෝ තමා හාමත්ව සිටින බව ඊළඟට රිචර්ඩ්ට දැනිණ.

මෙපරිද්දෙන් වාඩිවී සිතිවිල්ලේ පසුවන අතරම රිචර්ඩ්, ට්‍රන්ට් විලේ ප්‍රතිවිරුද්ධ අන්තය දෙසට දෑස් යොමුකළේය. මේ සා උස් ස්ථානයක හිඳ එය මැනවින් දැකගත හැකිය. දිය වඩාත් පැහැදිලි වූවෙන් විලේ පාෂාණමය පතුලත්, ඒ මත වන කොළ පැහැති පෙඳ පාසි ඇතිරිල්ලත් හොඳින්ම පෙනිණ. විටෙක තුරුවදුලු අතර සැඟවෙමින්ද, විටෙක මතුවෙමින්ද වන අභ්‍යන්තරය හරහා විහිදෙන 'වෙළෙන්දන්ගේ අඩිපාර' වශයෙන් හැඳින්වෙන, කුඩා අඩිපාර ඇරඹෙන්නේද එතැනිනි. රිචර්ඩ් එම මාර්ගයේ, මේ ඉසව්වේ, බොහෝ වාර ගණනක් ගමන් කර ඇතත් වෙළෙන්දන්ගේ අඩිපාර, බොහෝදෙනෙකු මඟහරින පටුමඟකි. වසන්ත ඍතුවේදී විල ආසන්නයට වන්නට වෙළෙන්දන්ගේ අඩිපාර තෙත්ව පවතී. එහෙත් වර්ෂාව නොවැටෙන මෙවන් කාලවලදී එය මුළුමනින්ම වියැළී තිබේ. 'හාර්ට්ලන්ඩ්' වනය පසුකරමින් 'වෙන්' වනය දක්වා ඇති කෙටිම මාර්ගය මෙය වුවද බොහෝදෙනෙක් එහි ගමන්ගැනීම ප්‍රතික්ෂේප කරති. ඒ වෙළෙන්දන්ගේ අඩිපාර විහිදී තිබෙන්නේ සීමා-බාධකය ආසන්නයෙන් වන බැවිනි. රිචර්ඩ් කලෙක මඟ -පෙන්වන්නෙකුව සිටියේය. වනාන්තරය අතුරින් ගමනේ යෙදෙන්නන්ට මාර්ගය කියාදෙමින්, ප්‍රවේශම් සහගතව ඔවුන්ව ඉදිරියට රැගෙන යෑම එකල ඔහුගේ රාජකාරිය විය. එහෙත් බොහෝ සංචාරක ප්‍රභූවරයන්ගේ අවධානයට බඳුන් වූවේ මඟ-පෙන්වන්නාගේ කීර්තිය මිස ඔහු තුළ පවත්නා දැනුවත්භාවය නොවේ.

අඩිපාරේ වන තුරුවදුලු සළුව අතුරින් එක්වරම දක්නට ලැබුණු සෙලවීමක්; මිනිසෙකුගේ යැයි සිතිය හැකි ඡායාමාත්‍රයක් හේතුකොටගෙන කොලුවා ත්‍රස්ත වනවිට ගතව තිබුණේ තවත් ස්වල්ප වේලාවකි. තමා එවැන්නක් දුටුවේද යන සැකය ඒ හා සමගාමීව සිතට

www.musesbooks.com

Copyrighted Material



පිවිසියෙන් රිචර්ඩ් වඩ වඩාත් අවධානයෙන් බලාසිටියේය. දෙවන වරටත් සෙලවීම, එහි සැබෑ ලෙසම මිනිසෙකු ගමන්ගන්නා බවට ඔහු තුළ උපන් සැකය, සැකයක් නොවන බැව් තහවුරුකොට දුන්නේය. ඇතැම්විට ඒ ගමන්ගන්නේ තම මිතුරෙකු වන චේස් විය හැකිය. සීමා-බාධක රැකවලෙකු හැරුණුවිට, මේ ඉසව්වේ කරක්ගැසීමට තරම් දිරි උපදවාගන්නේ කවුද?

වාඩිවී හුන් ගලෙන් බිමට පැන, අත රැඳි ඉපල් කැබැල්ල පසෙකට විසිකළ රිචර්ඩ් තවත් පියවර කිහිපයක් ඉදිරියට තැබුවේ මිතුරා හමුවීමේ අපේක්ෂාවද සහිතවය. එහෙත් විලට ආසන්න වෙත්ම ඔහු දුටු රුව අඩිපාරේ එළිමහන් ස්ථානයකට පැමිණිණි. ඒ චේස් නොවේ. අඩුමතරමේ පිරිමියෙකුද නොවේ. ඒ කාන්තාවකි. අමුතුම ආකාරයේ ඇඳුමක් හැඳගත් ගැහැනියකි. පිරිමින් පවා මඟහරින මෙවන් ඉසව්වක, වෙන් වනාන්තරයෙන් මේ සා දුර බැහැරක, මෙවන් ආකාරයේ ඇඳුමක්ද හැඳගෙන ගමනේ යෙදෙන්නේ කුමන කාන්තාවදැයි රිචර්ඩ් පුදුමයට පත්විය. දැන් ඈ විල් ඉවුර ඔස්සේ ඉදිරියට ඇදෙමින් හිඳියි. විටින් විට තුරුවදුල අතරින් නොපෙනී යමින්, විටෙක යළි මතුවෙමින් අඩිපාර ඔස්සේ ඈ ගමන්ගත් විලාසය ඔහු බලාසිටියේ පාෂාණීභූත වූවාක් ලෙසිනි. ඈ යෙදුණේ කලබලකාරී කඩිනම් ගමනක නොවේ. එමෙන්ම වනපෙතේ රුසිරි නරඹමින් හක්කලමේ යෙදෙන ලැසි ගමනකද නොවේ. ඒ සමස්ත වනපෙතම අත්ලේ වන රේඛාවක් පරිද්දෙන් හඳුනන, පළපුරුදු සංචාරකයෙකුගේ විලාසයෙන් කෙරෙනු ලැබෙන ගමනකි. එහෙත් ඈ මේ ඉසව්වේ ජීවත්වන්නියක නොවන බව නම් ඉඳුරාම කිව හැකිය. මන්ද, ට්‍රන්ට් විල ආසන්නයේ වාසස්ථානයක් ඉදිකරගත් කිසිවෙකුත් නැත.

තරුණිය දෙසම යොමුවී තිබූ කොලුවාගේ බැල්ම එක්වරම ඈ කෙරෙන් මිදුණේ ඒ හාත් සමගම දක්නට ලැබුණු තවත් චලනයක් හේතුවෙනි. ඡායාමාත්‍රයන්, විනිවිදින බැල්මෙන් පිරික්සන රිචර්ඩ් එහි සිටින්නේ මිනිසුන් තිදෙනෙකු බව ඉනික්බිති හඳුනාගති. තිදෙනෙක්, නැත. ඒ සිව්දෙනෙකි. ගසෙන් ගලට, ගලෙන් ගසට මුවාවෙමින් වන-කබායෙන්ම සැකසුණු හිස් ආවරණයෙන් සඟවාගත් මුහුණුද සමඟින් තරුණියට යාර ගණනාවක් පසුපසින් ඔවුන් යෙදුණේ රහසිගත ගමනක යැයිද ඔහුට සිතුණේය.

නිසැකවම උහු ඇයව ලුහුබඳිමින් සිටිති.

අන්තරායේ තෙවැනි දරුවා උත්පත්තිය ලැබූ බැව් ඔහු එක්වනම අවබෝධකොට ගත්තේය.

www.musesbooks.com